# නිර්මාණ Nirmana

## 60 වසරක අස්වැන්න

නිදහස ලැබී හැට අවුරුද්දක් ගෙවුණා
එය සිහිකරන්නට යන බව මට ඇහුණා
තැන තැන මල් තොරණ් ඉදිවන බව පෙනුණා
හිටිවන මගේ කවි සිත දැහැනින් මිදුණා

යහගුණ දහම් රිංගා ගොස් තුළ බැද්ද
මුළු සිරිලක පුරා පැතිරී ඇත යුද්ද
පාලක පෙළගෙ වැඩ නැත තරමට සද්ද
සමරන්නට තරම් නිදහසකුත් ඇද්ද?

බත නැතිවුණා සිරිලක දිය සිඳී කෙත
සිංහලයාට එරෙහිව යුද වැදී ඇත
අපෙ බඩ වියත පිටරට මත රැඳී ඇත
පරගැති බවින් අප තවමත් මිදී නැත

ගොංගාලේගොඩද කැප්පිටිපොළ වීර
පුරන්අප්පු වාරියපොළ හිමි සූර
ඩී. එස්. දහම්පල් මිහිඳු ද කවි කාර
ලැබ දුන් නිදහසට වැදුනිය හෙණ පාර

බලයට පැමිණ වන්දෙන් හෙළයන් තේරු
තම මළු පිරෙන ලෙස කරමින් පිල් මාරු
වැඩ කළ බවක් නැත පමණකි කයි වාරු
හැම තැනකම පෙනේ නිදහස වල් බූරු

පෙර හෙළ දෙරණ මුළු ලෝකයට විය මලක්
පස් පියුමෙන් සැදුම් ලත් කදිම දිය විලක්
අද දින පෙනෙන්නේ එය එකම මඩ වලක්
දම් දීපයක් වූ සිරිලකට ගිය කලක් ?

♦ **පූජ්‍ය මිගහතැන්නේ රතනජෝති හිමි**
**සුනන්දාරාමය ගම්පහ Sri Lanka**

## සක්සඳ අමතයි

හිතවත් මිතුර මාවෙත සෙනෙහස පුදන
තොරතුරු ගෙනා ලිපියෙන් හද කිති කැවිණ
සා පැටවුන්ද සමගින් තුරුළෙහි නිදන
ඔබ සිහිපත්ව දෙකොපුල් කඳුලින් තෙමිණ

ගිය බව අසා පෝ දින ඔබ කැළණි යට
දැක ගනු රිසින් ආවෙමි මම ගං තෙරට
ඇස නොගැසුණිය සිත යොමුවිණ පෙරහැරට
මුසපත් වුණා නොදැනිම නැගි බෙර හඬට

සීතල මුසුව සැඩ සුළඟක් නැග එනවා
ලන්ඩන් නුවර මහ වැස්සට සේදෙනවා
සමහර පෙදෙස් ගං වතුරට යට වෙනවා
තේම්ස් නදිය දැන් නිතරම සැර වෙනවා

සැම වසරක්ම ගතවිය නිදහස ලබලා
නව දියුණුවක් ලැබුවද බලමුකො සොයලා
නොකලොත් යමක් මැතිඳුන් රට ගැන සිතලා
පිට බලවේග එයි සිරිලක වෙත පෙරළා

උතුරේ ප්‍රශ්නයට පිළිතුරු ඇයි නැත්තේ
බැඳි ගැට ලිහා තීරණයක් ගත යුත්තේ
රුපු බල බිඳින්නට යුද ශක්තිය මත්තේ
නිරිඳුන් එකල වුව එහෙමයි ජය ගත්තේ

♦ **මේජර් වී. බී. කරුණාරත්න**
**Oxford UK**

## නාගහමූල දේවාලය

අවුරුදු සිය ගණන් ආසිරි ලැබූ වාට
දෙවි බැතිමතුන් එති ආසිරි ලැබී මට
පිහිටයි කියා පවසති දනෝ පෙර සිට
නාගහ මුල දෙවොලයයි කියනව එයට

විසේසයකි මම දන්නා මෙහි කියන
නැත පිළිරුවක් ලැබුමට ආසිරි පතන
පොහොසත් දනන් සිටියත් ගම මෙහි වෙසෙන
දෙවිරුපයක් නැත මෙහි පඬුරුද ලන්න

මා ඒ ළහම නිවසක් තැනුමට සිතුවා
දෙවොලට පඬුරු ලා මා ඒ ගේ සැදුවා
දෙවි රූ නොමැති මුත් එහි අනුහස් බෝවා
පත්තිනි මැණියන් ගෙට ආසිරි පැතුවා

බාරය විලස මැණිගෙ රූපය නෙලුවා
දස දහසක් මුදල් ඒ වෙනුවෙන් ගෙව්වා
කණ්ඩලමේ දෙවොල තුළ ගෙනැවිත් තැබුවා
පෙරහරකින්ම නව දෙවොලට වැඩ මෙව්වා

අනුහස් බොහොය පත්තිනි මැණියන් හට
පුද පූජා තබති දන එහි සැම විට
වැඳුම් පිදුම් කෙරෙනා හැම වෙලා වට
ලැබෙනව එයින් පින් කොටසක් ද මා හට

♦ **රත්නාවලි කුමාරි දිසානායක**
Hounslow Middx **UK**



## නිදහස් ලංකා

සාගරයක් මැද තනිව සිටින මුතු ඇටයකි ඔබ ලංකා
බටහිර ලෝකෙන් ජනයා ආවේ ඔබ කුළුබඩු හින්දා
ඇවිදින් දුටු ඒ සුන්දර දිවයින උන් හද වශී කළා
එය තමනට අත්පත් කරගන්නට ඉන්පසු සටන් කළා

රබර්ද තේ පොල් වටිනා ධනයෙන් නැව් පුරවා ගත්තා
කුළු බඩු මිණිමුතු පිටරට පටවා ආදායම සෙව්වා
කිතු දම පතුරා පාසැල් තනවා හෙළ බස යටත් කළා
නාවුක බලකායක් ලෙස දූපත යුද්දෙට පිහිට වුණා

දේශප්‍රේමී වීර පුතුන් ඔබ නොඅඩුව බිහිකෙරුවා
නිදහස වෙනුවෙන් ඒදරුවන් හැම සිය දහඩිය හෙලුවා
පෘතුගීසි ලන්දේසි ඉංග්‍රීසි පාලනයෙන් ඔබ ඉවත් කළා
සිංහ ධජය පෙරමුණු කරගත් ලක නිදහස ලැබ ගත්තා

අවාසනාවට නරුම දනෝ මැරවරකම් වල යෙදුණා
සාමය සමගිය බිඳී කෝලහල භේද ගැටුම් පිරුණා
යෞවන ජීවිත දහසක් එමගින් දේසෙට අහිමි වුණා
අසරණ දරුවන් අනාථ බිරියන් ඔබ හට බරක් වුණා

සිංහළ මුස්ලිම් දෙමළ ආදි හැමගේ දියුණුව සළසා
දකුණ නැගණහිර බටහිර උතුරද එකබිම ලෙස සලකා
දැ කුල ආගම් බේද කිසිත් නැති සමගි දමෙන් බැඳිලා
ඔබ යහපත වෙනුවෙන් කැපවුණු දරුවන් තව බිහිවේවා

අවුරුදු හැටකට පෙර තිබු ශක්තිය යළිදු ළහා වේවා
ජාතියෙ දරුවන් පුබුදාලන නව හිරක් උදා වේවා
රුධිරෙන් බොඳ වූ මැත අතීතය සදා තුරන් වේවා
වීරවිකුම් පා නේක සිරින් ඔබ ලෝ තුළ බැබලේවා!

♦ **රසිකා ලීලානන්ද ජයතුංග**
West Midlands **UK**

## පිටියෙන් සමුගත් වීරයා සනත්ට !




පුරහඳ විලස පැයූ
ලක් අහස් ගැබේ
මාතර පුරවරයෙ
බැබලෙන මැණික වගේ
ජයසූරිය සනත් නම
දත් ලොවම වගේ
සමුගත් නමුත් රන්
අකුරින් ලියැවි තිබේ

හයේ පහරවල් සහ හතරේ පහර
වදිනා විටදි විසිවෙයි ගව්වක් විතර
ඊතලයක් ද විද්දේ ඒ දුර කතර
අපි හිනැහුණා උඩ පැන්නා දහස් වර

ලොවින් එකෙක් එක් දෙයකට වෙයි සමත
ඉපැරණි කියමනකි පෙර සිට එන පැවත
පෙන්වා පිති හරඹ මුළු ලොව කළ සළිත
පිටියෙහි රිදී රේඛාවයි ඔබ නියත

පිත්තෙන් බෝලයෙන් පෑ විස්කම් හින්දා
සිරිලක් නාමයට ඔබ ජයකොඩි බැන්දා
රට්ටුන් පිටරටුන් හද සෙනෙහස රන්දා
ඔබ පෑ විකුම් බලමින් සොම්නස වින්දා

පිටියෙන් නික්ම ගියමුත් නිසි කල වයසේ
පෙර කළ විකුම් ලක් දන හද තුළ ගැවසේ
ආසිරි සෙමර සලමින් සෙනෙහෙන් මෙලෙසේ
පතනෙමි ඔබට දිගු ආයුෂ හෙට දවසේ

♦ **චන්ද්‍රා මාලිනී විජේසූරිය**
**Paris - France**

## සෙබළ මවකගේ උදානය !

පා යුග යොවුන් දොරකඩ වෙත ඇදෙන කල
බලමුළු රුපුන් බිඳ රකිමින් දෙරණ තල
හසරැළි පිපේ දුටු සඳ පුතු ගතෙහි බල
නව රැස් පොකුරු සනහාලයි තොප්පි ගල

ලක එක සෙවනකට ගන්නට නොබිය සිතින්
යන විට කටු පඳුරු වන දිය කඳුරු මතින්
කඳුලක් නැගෙයි එය දුටු හැම මවක නෙතින්
දිව රෑ එකම ලෙස හිඳිනෙද පුතේ ඉතින්

ලේ කැටි කඳුළු දහදිය පුදකරන විට
රට දැ රකින තෙද එඩි බල රැඳෙන විට
දෑ හැඟමෙන් පෙරට නුඹ පිය නගන විට
නුඹෙ මව් වුනේ පිනකට දෝ සිතෙයි මට

වැහි කැට විසල් සැඩ හිරු දැක අහස් ගැබ
හදවත් නිවන සිහිලැති පණ නලක් පිඹ
සුරුවිරු හැඟුම් දී ගොවි සිහිනයන් සුබ
මාවිල්ආරු වතුරට පෙම් කළෙත් නුඹ

හෙළ දැ පොරණ විරු ගුණ කඳ හදෙහි වෙතේ
අබිමන් ගෙනෙන දිය උල්පත් ගලා එතේ
පෙවු කිරිවලින් සවි සත්තිය ඇතිව ගතේ
සාමයෙ සිසිල් පැන් හෙට දින ඉසින් පුතේ

♦ **දුලාංජලී සිරිවර්ධන**
**නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය**

## ඇරිසෝනාවේ විශ්මිත ග්‍රෑන්ඩ් කැනියන්

ගිනිකඳු වැස්ස හා සුළඟින් පීඩාවී
අවුරුදු ලක්ෂ ගණනක් ලොව වෙනස් වෙවී
මේ ලෙස හැදී ඇති බව විස්වාසය වී
ලක්ෂ දෙසිය හැත්තෑ වසරකි හමුවී

මේ ලෙස වෙනස් වූ පෙදෙසට කියන නම
ග්‍රෑන්ඩ් කැනියන්ය කියලා හැඳුනෙ නම
හැරී ගොසින් මහ පෙදෙසක් ඇතුළ ටම
දුටු විට හිතෙනවා මට නම් හරි පුදුම

ගැඹුරට හැරිලා ඇති මේ මහ පොළ වේ
උඩ සිට පහත දක්වා පස්කඳු දිස් වේ
සමහර තැනක ලොකු උස ගල්කඳු හමු වේ
කැටයම් කෙරු මාලිග වැනි කඳු දිස් වේ

නිල් රතු කොළ කහ ද සුදු පැහැගැන්වූ වේ
කුණු ලේ හා දුඹුරු පැහැ පස් ගල් කඳු වේ
අතරින් පතර කොළ පැහැගත් ගස් හමු වේ
කැනියන් පතුලෙ කොලරාඩෝ ගඟ ගැළු වේ

කැනියන් එකේ උඩ සිට පතුලට පෙනෙන
ගුරු පාරක් තිබේ පහතම තැනට යන
බූරුවො පිටේ සමහර අය යන ගමන
සමහර අය ගියා පහළට ඇවිද ගෙන

දිග සැතපුම් දෙසිය හැත්තෑ හත විතර
උතුරු දිගින් කැනියන් පතුලේ ගැඹුර
අඩි පන්දහස් හත්සීයක් වූ අතර
දකුණේ හාරදස් පන්සීයකි ගැඹුර

කැනියන් එක වටා පළමුව බෝට් ටුවේ
මේජර් ජෝන් ගොස් එහි පළලද දුටුවේ
වර්ජිනියා බටහිර නදියට ළංවේ
කැනියන් කෙළවරය අප එතැනදි දුටුවේ

♦ **ජෙස්මින් අබේරත්න** USA

### පැරණි සිව්පදයක්

සිත නැති දනෝ කොයි දේ දුන්නත් පිනට
වැට නැති ගොවිපළේ බිජු වැපිරු ලෙසට
සිත නැති අයට සිල් දුන්නත් එම ලෙසට
වදි නැති මිණිගෙඩිය බැන්දා වැනි ගොනුට

## සොයුර්ය සුනිතා

කොටි උවදුරෙන් මව්බිම බේරා ගන්න
දිවි පරදුවට දී යුදබිම වෙත යන්න
අතපය අහිමි රණවිරුවන් සන සන්න
වෙහෙසුණ සිහල මහතෙකු හට දිරි දුන්න

ඔබ අද නැතත් අප'තර වෙන ලොවක ගොසින්
ලක්මව දෙස බලා සුපුරුදු කුළුණු ඇසින්
පෙර ඔබ හිමිට දුන් දිරියම මහඟු ලෙසින්
දෙනු මැන තවත් එලොවෙහි ඉඳ නිහඬ බසින්

තම ජීවිතය දරු කැල දෙවෙනියට දමා
ලද හැම ධනය නොමසුරු ලෙස දැයට යොමා
ඔබ කළ හරිය රට දැය වෙත දෙනෙත යොමා
සැහෙයි ලැබ ගන්න මතු දින නිවන අමා

වැය කළ දිවිය රට දැය වෙනුවෙන් සොඳට
සැහෙයි ඔබට සගමොක් සුව ලබන් නට
ඔබ දුන් දිරිය ලක්මවගේ දරු වන්ට
අගයමි හිස නමමි සොයුරිය ඔබ නමට

♦ **මධුරි අබේවික්‍රම** Harrow **UK**

## Uncontrollables

Spring brings the taste of salt
To my tongue
When I see the cherry blossoms;
Sun's favourite Pop cones

Roses and Camellia bushes
Get regular hair cuts
Then more leaves leap
All over their bodies

I crush and suppress
My longings and desires
They thrive and bloom
In multitudes

♦ **Sriya Kumarasinghe**
**New Zealand**

### යුද්ධය හා සාමය

**යුද්ධය නමැති ඉරුණු කබාය
අණ්ඩ දැමීමට
නෝර්වේ සාම රෙදි
ගැලපෙන්නේ නැත
හීන් නූලෙන්
පරෙස්සමෙන්
එලලිය යුතුය එය.**

**වසන්තා කුමාරි දසනායක**
මයිලවලාන කිරිඳිවැල

## මැණිකක් වන්න !

කප්පරක් කඳුළු මිරිකා බිහිව
සුවහසක් සුපසන් සිනා දුන්
මගෙ සුහදිනි සුදු දුව
යකුලක් සෙලක වැදුනද
සසලක් නොවන් නුඹ හද
දෙරණක් සේ දරා වද
නැගිටිනු මැනවි සුදු දුව
යන මග කටුකතා මැද
හසරැළි නගා මුවරද
ලක් මවගෙ නම් ලද
මැණිකක් වන්න සුදු දුව!

♦ **සුධර්මා වීරක්කොඩි**
Coleraine, **Northern Ireland**



### අපේක්ෂා

නිල් මහනෙල් පෙති මැලවිලා
විල් දිය කොඳමල් ඇහැරිලා
සඳ දිය දහරේ වැතිරිලා
ඉන්නම් එනතුරු මග බලා

තරු නෙතු පියවිලි වෙහෙසිලා
ලවනත හසකැන් වියැකිලා
සියොලඟ සුසුමින් දැවටිලා
ලොවකට රහසින් වැලපිලා

ගව් සිය ගණනක් දුර බලා
සිතුවිලි සියොතුන් ඉගිලිලා
ඔබ හෙට නාවත් සිත පෙලා
මගෙ සෙනෙහස ඇත මග බලා

♦ **සන්ධ්‍යානි සේනාරත්න**
**London SW15**

## එම් හනික ඔබ සොයා

සමුගෙන ආවෙ හිමියනි ඔබ තනි කරලා
හිතකින් නොවේ මතු අප දියුණුව පතලා
ගත මෙහි ඇතත් සිත එයි ඔහි පිය ඕලා
කිසි දින වෙනස් නොමවී එම් ඔබ සොයලා

ජීවිතයට ඔබයි මගෙ නොනිමෙන පහන
ඔබ සෙනෙහස වටී රන් මිණි මුතු ලෙසින
නොමදී දුක් සුසුම් ඔබ සැනසී ඉන්න
මම එම් හනික නොවෙනස් සෙනෙහස රැගෙන

යූරෝ වලට අපෙ ජීවිතෙ ගෙවෙන විට
මතක් වෙනව ඔබෙ සෙනෙහස විටින් විට
දිළිඳුකමයි එරෙහිව දිවියෙහි මුලට
සැනසී ඉන්න මං එනවා ඉක් මනට

♦ **සපුමලි විජේසුන්දර**
**Ilford - Essex UK**